
# නිදහසේ නායකත්වයත් සංකේතයත් ඩී.ඇස්

**නිදහස් ලංකාවේ ප්‍රථම අග්‍රාමාත්‍ය මහාමාන්‍ය ඩී.එස්. සේනානායක මහතාගේ 138 වැනි ජන්ම දින සංවත්සරය ඉකුත් 20 වැනිදාට යෙදුනි. මේ ලිපිය ඒ නිමිත්තෙනි.**



1948 නිදහස ලබාගෙන පාර්ලිමේන්තුවේ බහුතර බලය මත ඩී.එස්. සේනානායකගේ නායකත්වයෙන් ප්‍රථම රජය ස්ථාපනය කරන විට සාපේක්ෂ වශයෙන් විශේෂයෙන්ම ඒක පුද්ගල ආදායම හා අප රට සතු විදේශ සංචිත මෙන්ම රුපියල් සංචිත මත ශ්‍රී ලංකාව ශක්තිමත් තත්ත්වයක පැවතිණි. යටත්විජිත යුගය අවසන් වන කාලය තුළ ලෝකය මුහුණ දුන් දෙවන ලෝක යුද්ධය එක් අතකින් ශ්‍රී ලංකාවට ආර්ථික වශයෙන් වෙස්වලාගෙන පැමිණි ආශිර්වාදයක් විය. එසේ වීමට හේතු වූයේ මිත්‍ර පාක්ෂික යුද කඳවුරේ මහා බ්‍රිතාන්‍ය ප්‍රමුඛ කණ්ඩායම ආසියානු යුද්ධ හමුදා මූලස්ථානය බවට ශ්‍රී ලංකාව තෝරා ගැනීමයි. ඒ අනුව පූර්ව නිදහස් යුගයේ අවසානය වනවිට ශ්‍රී ලංකාවේ දළ ජාතික ආදායමින් හතරෙන් එකක්ම යුද්ධය සම්බන්ධ සිදුකළ වියදම් මත දළ ජාතික ආදායමට එක්වුණ දායකත්වයයි. එහෙත් යුද්ධය අවසන් වීමත් සමග කටුනායක හා ත්‍රිකුණාමලය තුළ තවදුරටත් ශ්‍රී ලංකාවේ ඉල්ලීම මත, එනම් ශ්‍රී ලංකාව හා මහා බ්‍රිතාන්‍ය අතර අත්සන් කරන ලද ද්විපාර්ශ්වික ආරක්ෂක ගිවිසුම අනුව හමුදා කඳවුරු පවත්වාගෙන යාම සඳහා එක්කරන ලද සුළු ආදායම් ප්‍රතිශතය හැරෙන්නට අනෙක් සියලු ජාතික අවශ්‍යතාවයට අවශ්‍ය පරිදි ආර්ථිකය වර්ධනය කර ගැනීමේ වගකීම ඩී.එස්. සේනානායක මහතාගේ නායකත්වයෙන් යුත් එජාප රජයට පැවරිණ.

ස්වාධීන රජයකට අවශ්‍ය පරිදි මූළු ක්‍රමය කළමනාකරණය කර ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව ස්ථාපනය කිරීමත් ක්‍රමවත් ආර්ථික ප්‍රතිපත්තියක් යටතේ ආර්ථික සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීමට සය අවුරුදු සැලැස්මක් ක්‍රියාත්මක කිරීමත් නව රජය යටතේ සිදුවිය. ආනයන අපනයන ස්වල්පයක් මත රඳා පැවතුන ආර්ථිකයට ශක්තිමත් දේශීය කෘෂිකර්ම අංශයක් ඇතිකරලීමටත් රජය හා දේශීය ව්‍යවසායකයන් ධෛර්යමත් කිරීම තුළින් කාර්මිකකරණයක් ඇතිකරලීමට සිමෙන්ති, කඩදාසි, සීනි, රසායනික ද්‍රව්‍ය, පිඟන් වැනි රාජ්‍ය අංශය යටතේ මෙන්ම පෞද්ගලික ව්‍යවසාය යටතේ කාර්මිකකරණයට අවශ්‍ය මූල්‍ය පහසුකම් සැපයීම සඳහා බැංකු හා විශේෂිත මූල්‍ය ආයතන ඇතිකරලීමත්, පෞද්ගලික අංශයට අවශ්‍ය තාක්ෂණික මගපෙන්වීම් හා උපදෙස් සඳහා රාජ්‍ය ආයතනත් ඇති කරනු ලැබීය.

නිදහස ලබාගන්නා විට සම්මත වී තිබූ නිදහස් අධ්‍යාපන පනත ඔස්සේ නේවාසික පහසුකම් සහිත මධ්‍ය මහා විද්‍යාල රට පුරා ස්ථාපනය කළ අතර විද්‍යා හා ඉංග්‍රීසි අධ්‍යාපනය භූගෝලීය වශයෙන් විශේෂයෙන්ම පහේ ශිෂ්‍යත්ව විභාගය පාදක කරගෙන රට පුරා ව්‍යාප්ත විය. ඒ තුළින් දුප්පත් මවුපියන්ගේ දක්ෂ දරුවනට අවස්ථාව ප්‍රායෝගිකව ලැබීමේ සමාරම්භය සිදු වූයේ නිදහස ලැබීමත් සමග මධ්‍ය මහා විද්‍යාල ඔස්සේ ව්‍යාප්ත වුණ පාසල් අධ්‍යාපනයේ ප්‍රතිඵලයක් ලෙසයි. මෙයත් අවුරුදු 74ක සාපයේ කොටසක් දැයි අවුරුදු 74ක සාපය ගැන කතා කරන අරගලකරුවන් රටට ප්‍රකාශ කළ යුතුය.

**ආචාර්ය කරුණාසේන කොඩිතුවක්කු**

අවුරුදු 74ක ශාපයක් ගැන කතා කරන දේශපලනඥයන් මෙන්ම 1940 දශකයේ සිටි විපක්ෂ දේශපාලනඥයන්ගේ කර්කශ විවේචන හා විරෝධතා මධ්‍යයේ 1933 දී මින්නේරිය ව්‍යාපාරයෙන් ආරම්භ වුණ ගොවි ජනපද ව්‍යාපාරය ඩී.එස්. සේනානායක දේශපාලනයේ සදකාලික සංකේතයයි. 1948 නිදහස ලබාගැනීමත් සමග ගොවි ජනපද ව්‍යාපාරයේ අලුත් පිටුවක් අරඹමින් ගල්ඔය බහුකාර්ය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වූ අතර එම බහුකාර්ය ව්‍යාප්තිය තවදුරටත් ඉදිරියට යමින් උඩවලව ව්‍යාපාරයත් මෙම ඊනියා ශාපලත් අවුරුදු 74 තුළ ක්‍රියාත්මක විය. මහවැලි වතුර රජරටට ගෙන යාමේ ඩී.එස්. සේනානායකගේ සිහිනය 1965-70 යුගය තුළ ඩඩ්ලි සේනානායක යුගයේදී ක්‍රියාත්මක වූ අතර 1977න් ඇරඹුන ජේ.ආර්. ජයවර්ධන යුගයේදී මහවැලි බහුකාර්ය ව්‍යාප්තිය සම්පූර්ණ විය.

එහි ප්‍රතිඵලයක් ලෙස නව නගර සංවර්ධන සහිත නව ජනාවාස රජරට බිහිවිය. විදුලි බල සැපයුමට ඉතා අඩු වියදමකින් කොත්මලේ, වික්ටෝරියා, රන්දෙනිගල, රන්ටැඹේ, උකුවෙල හරහා මහවැලි ව්‍යාපාරය තනි ව්‍යාපාරයක් ලෙස විශාලතම විදුලිය සැපයීම ජාතික විදුලිය බල පද්ධතියට එක්කරනු ලැබීය.

අද ඇතිවී තිබෙන ආර්ථික බංකොලොත්භාවය අවුරුදු 74ක් තිස්සේ ඇතිවුණ සාපයක් නිසා නොව අවුරුදු 74කට පෙර ගොඩනැගීමට ආරම්භ කළ ජාතික ආර්ථිකය වරින් වර වෙනස්කම්වලට හා අත්හදා බැලීම්වලට ලක්කළ අවස්ථාවේදී ප්‍රතිපත්ති හා සැලසුම් කඩාකප්පල් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ඇති වුණ දෙයකි.

1948 ක්‍රියාත්මක වුණ සය අවුරුදු සැලැස්ම නිසි ලෙස ක්‍රියාත්මක වුවද 1951 ඩී.එස්. සේනානායක රජය ලෝක බැංකුවට කරන ලද ඉල්ලීම මත ලබාදුන් යෝජනා හා උපදෙස් මත 1954 සිට ක්‍රියාත්මක වුන දෙවන සය අවුරුදු සැලැස්ම ක්‍රියාත්මක වීම 1956 සිදුවන ආණ්ඩු පෙරළියත් සමග අත්හැර දැමිණි. 1948-56 තුළ ඇතිවූ ආර්ථික ප්‍රගතිය කොතරම් සාර්ථකදැයි යන්නට ඇති හොඳම සාධකය වන්නේ 1956 මැතිවරණයේ ප්‍රධාන මාතෘකාවක් වූයේ ආර්ථික ප්‍රශ්න නොව භාෂාව හා ආගම වැනි ලාංකික සමාජය බෙදා වෙන්කරන ජාතිවාදී හා ආගම්වාදී ප්‍රශ්න මුල්කරගෙනයි. 1948-56 යුගයේ තිබූ එකම ආර්ථික ප්‍රශ්නය වූයේ ලෝක වෙළඳපොළේ මිල ඉහළ යාමත් සමග එයට සමගාමීව ආනයනය කරන ලද සහල් මිල ගැළපීම මත මෙරට වාමාංශික ව්‍යාපාරය සංවිධානය කරන ලද හර්තාලයයි. එහෙත් එම ප්‍රශ්නය මාස කිහිපයකින් සමථයකට පත් විය.

1965-70 තුළ ස්ථාපනය වුණ ඩඩ්ලි සේනානායක මැතිතුමන්ගේ නායකත්වය යටතේ වූ රජය රටේ අභාවයට යමින් තිබූ ආර්ථිකය යථා තත්ත්වයට ගෙන ඒමට ජාතික කෘෂිකර්මය විද්‍යාත්මක පදනමක් යටතේ හරිත විප්ලවය ක්‍රියාත්මක කරලීමේදී මෙන්ම මහවැලි සංවර්ධන පනත පාර්ලිමේන්තුවේ සම්මත කර ක්‍රියාත්මක කරලීමේදීද දහසකුත් එකක් බාධා එල්ල කරනු ලැබූහ. උතුරු නැගෙනහිර පළාත්වල ජනතාවගෙන් බහුතරයක් කතා කළ ද්‍රවිඩ ජනතාවට තමන්ගේ පරිපාලන කටයුතු හා උසාවිවල අධිකරණ කටයුතු තමන්ට තේරෙන තමන්ගේ මව් භාෂාවෙන් එනම් ද්‍රවිඩ භාෂාවෙන් ඉටු කරගන්නට අවස්ථාව සලසමින් ද්‍රවිඩ විශේෂ විධි විධාන පනත 1966 දී සම්මත කරලීමේදී විශේෂයෙන් ශ්‍රී ලකා නිදහස් පක්ෂය, ලංකා සමසමාජ පක්ෂය, ලංකා කොමියුනිස්ට් පක්ෂය ප්‍රමුඛ සභාගය එල්ල කළ දැවැන්ත විරෝධය තුළින් ශ්‍රී ලාංකික ප්‍රජාව ජනවාර්ගික පදනමකින් තව තවත් බෙදා වෙන්කරනු ලැබීය.

පසුකාලීනව සිදුවූ විවිධ ආර්ථික සමාජ දේශපාලන ප්‍රතිපත්ති වරින්වර ආණ්ඩු වෙනස්වීම් සමග අත්හදා බලමින් සිදුකළ දේශපාලනය වර්තමාන ශ්‍රී ලංකාවේ බංකොලොත් භාවයට ඇද දැමූ පදනම විය. ඩී.එස්. සේනානායකයන් 1931-48 කාලය තුළ අර්ධ නිදහසක් යටතේ ශ්‍රී ලංකාවට නිදහස ලබාගැනීම සඳහා සියලු ජනවර්ග එක් කරගෙන විශේෂයෙන් එම ජනවර්ග නියෝජනය කරන දේශපාලන නායකත්වයන් සම්බන්ධ කරගනිමින් උපායශීලීව බ්‍රිතාන්‍ය සමගද එකඟත්වයන් තුළින් ගෙන ගිය දුරදර්ශී දේශපාලන ගමන් මග නිසා නිදහස් සටනේ අවසාන පරිච්ඡේදය ලේ වැගිරීම්වලින් තොර විය.

රාජ්‍ය මන්ත්‍රණ සභාවේ කටයුතුවලදී ඩී.එස්. සේනානායක ලබාදුන් අසම සම දේශපාලන කෘතහස්තභාවය මත 1940 දශකය වනවිට ඔහු ජාතික දේශපාලන නිදහසේ නායකත්වයට නිරායාසයෙන්ම පත්වෙමින් තිබිණ. එම රාජ්‍ය මන්ත්‍රණ සභා දේශපාලනය තුළ ඇස්.ඩබ්ලිව්.ආර්. ඩී. බණ්ඩාරනායක, සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර, ආචාර්ය එන්.එම්. පෙරේරා, පිලිප් ගුණවර්ධන වැනි ප්‍රමුඛ පෙළේ සිංහල නායකයන් මෙන්ම ජී.ජී. පොන්නම්බලම් මෙන්ම ටී.බී. ජයා වැනි ද්‍රවිඩ හා සිංහල නායකයෝද වූහ. ඒ සියලු දෙනා අතරින් බහුතර විශ්වාසය මත සියලු ජනවාර්ගික නායකයන්ගේ ආශිර්වාදය හා සහයෝගය මත ජාතික නායකත්වයට නිරායාසයෙන්ම පත්වූයේ ඩී.ඇස්. සේනානායකයන්ය.

1948න් පසු ශ්‍රී ලංකාවට නිදහස ලබාගත්තා පමණක් නොව ඒ සමගම පොදු රාජ්‍ය මණ්ඩල විදේශ අමාත්‍ය සමුළුව කොළඹදී පැවැත්වීමටත් ඒ තුළින් ආසියාවේ නව නිදහස් රටවලට අවශ්‍ය විශේෂඥ දැනුමැති පුද්ගලයන් පුරුදු පුහුණු කිරීමට ''කොළඹ ක්‍රමය'' ස්ථාපනයත් ලොව ප්‍රබල රටවල් වන ඇමරිකා එක්සත් ජනපදය, මහා බ්‍රිතාන්‍ය, කැනඩාව, ඕස්ට්‍රේලියාව, ජපානය වැනි රටවල් සමග ජාත්‍යන්තර සබඳතා වර්ධනයටත් අවස්ථා උදා කළේය. ඔහුගේ විදේශ ප්‍රතිපත්තියේ සාර්ථකත්වය ඔහුගේ මගපෙන්වීම යටතේ 1951 ඇමරිකා එක්සත් ජනපදයේ සැන්ෆ්‍රැන්සිස්කෝ නුවර පැවති ජපන් සාම සමුළුවේදී ශ්‍රී ලංකාවෙන් සහභාගි වුණ ජේ.ආර්. ජයවර්ධන මැතිතුමන් ඉටු කළ භූමිකාවය. 1952අත්සන් කරන ලද චීන ලංකා රබර් සහල් ගිවිසුමට පදනම වැටෙන්නේද ඩී.ඇස්. සේනානායක යුගයේ ආරම්භ වුණ වෙළෙඳ සම්බන්ධතා ඉදිරියට යාමේ ප්‍රතිඵලයක් ලෙසය.